# තේ තතු

පර්යේෂණ ක්ෂේත්‍රයේ 81 වසරක අභිමානය
81 வருட ஆய்வின் சாதனை
81 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391 - 6785
සය වන කාණ්ඩය, පළමුවන කලාපය 2006 ජනවාරි - ජූනි


දේශ ජනිත දැනුමෙන් ...







## බිම් පැල වෙනුවට බැග් පැල හිටවමු ....?

දේශ ජනිත දැනුම තීරු ලිපි පෙළ තුලින් මා ඔබට ගෙන එන්නේ තේ පර්යේෂණායතනය ලෙස අප නිර්දේශ කරන තාක්ෂණයන් නොවේ. යම් අයෙක් මෙහි අඩංගු කරුණු අපගේ පර්යේෂණ නිර්දේශයන් ලෙස වරදවා තේරුම් නොගත යුතු බව මා සෑම ලිපියකම සඳහන් කර ඇත. තේ වගාවේ නියැලී සිටින, වගා කිරීමේ වියදම තම දෙවුරට දැනෙනා ප්‍රායෝගික මිනිසුන් තමන්ගේ තේ ඉඩම උපරිම ලෙස සාර්ථකවත්, වියදම් අවම වන පරිදිත් කර ගෙන යාමට ගන්නා අරගලයේදී බිහිවන, ඔවුන්ගේ ම ශ්‍රමයෙන් බිහිවී, කාලයත් සමඟම පරීක්ෂාවට ලක්වීම තුලින් ලත් පසු පෝෂණයෙන් තවදුරටත් ඔපවත් ව නිවැරදි වූ දේශීය තේ වගා තාක්ෂණයන් "දේශ ජනිත දැනුම" ලෙස මා ඔබට හඳුන්වා දීමට ගත් උත්සාහයක් පමණකි.. මේ තීරු ලිපි පෙළ.

මේ දැනුම විද්‍යාත්මකව අත්හදා බැලීමටත්, විශ්ලේෂණය කර බැලීමටත් අප පියවර ගන්නා බව ද මෙහි සටහන් කරනු කැමැත්තෙමි.

පසුගිය දිනෙක මිතුරන් කණ්ඩායමක් සමඟ සිංහරාජ වනය නැරඹීමට ගිය ගමනකදී මා ලද අත්දැකීමක් තේ වගා කරන ඔබගේ දැන ගැනීම සඳහා මෙහි සටහන් කිරීමට මා අදහස් කලා.

වඩාත් සුවිශේෂී වූ අත්දැකීම් ප්‍රියකල අපි කණ්ඩායම කුඩව නවාතැන්පලේ සිට සුපුරුදු ගමන් මගින් බැහැරව කුඩා තේ වතු මැදින් තිබූ අඩි පාරවල් දිගේ සිංහරාජය දෙසට පියවර තැබුවෙමු. වාහන යා හැකි මාර්ගයේ සිට හැතැප්ම එක හමාරක් පමණ පසුකල විට අප පසු කරමින් සිටියේ තේ වගා කිරීම සඳහා පැල සිටුවීමට සූදානම් කර තිබූ අක්කර කාලකට මඳක් වැඩි ඉඩමක් අසලිනි. අපගේ ගමනාන්තය කුමක් වුවද මගේ පෙරැත්තය නිසා ඒ ඉඩමේ මඳක් නැවතී මගේ දැනුම පිපාසය නිවාගැනීමට ඉඩදීමට මගේ සගයන්ට සිදුවුනා.

ඉඩමේ හිමිකරු වයස අවු 57 ක් වූ තේ ගොවියෙක්. නමින් සිරිපාල. මේ ඔහුගේ අක්කර එක හමාරක් පමණ වූ තේ ඉඩමේ අළුත් ම කොටස. මෙහි ඔහු පැල සිටුවීමට සූදානමින් සිටියත් සිටුවීම සඳහා ගෙන ආ පැල නම් ඒ අසල දක්නට ලැබුනේ නැති නිසා මම ඒ පිළිබඳ විමසිලිමත් වී මි. වැසුනු තේ පඳුරු සෙවනේ තිබූ බිම් පැල මිටි කීපයක් මගේ නෙත ගැටුනේ එවිට ය.

"ඇයි සිරිපාල බිම් පැල හිටවන්නේ මේවා හිටවපුවාම ටික කාලෙකට පස්සේ සිද්ධවෙන දේ ගැන සිරිපාල දන්නව ඇතිනෙ". "ඔව් මහත්තය.. බැග් පැල තරම් ම බිම් පැල හොඳ නැති බව මම දන්නව" . . . "ඒත් මේ බිම් පැල මම ම හදා ගත්ත ඒවා. පාත්තියෙන් ගලවගත්තෙ මුල්ලුවක් දාල අරං එන්නෙ මුල් ටික හොඳට තෙත රෙදි වල ඔතල. වරුවකදි හිටවන පැල ටික විතරයි එක වතාවකට ගේන්නෙ. තවානෙන් ගලවා ගන්න ඒවායින් හොඳට මුල් ඇදල තියෙන පැල විතරයි තෝරලා ගන්නෙ ". සිරිපාල කියාගෙන ගියා. අවුරුදු 20 ක් පුරා ම බැග් පැල දිහා පමණක් ම බලා හිටි මා තවත් විමසිලිමත් වුනා.

"ඒ කොහොම කලත් සිරිපාල ඔයා මේ පැල හිටවන කොට හුඟක් වෙලාවට හිටවන්නේ මුල් ටික පොලොවෙ මතුපිට හිටින්නනෙ. අනිත් එක මුල් ටික කෙලින්ම පහලට නොහිටින හින්දා පැල වල මේ මුල් ටික හැමදාම පොලොවෙ උඩ හරියෙ විතරක් තියෙයි... පායන කාලෙට මේ හින්දා තේ ගස් කඳ පිලිකා රෝගයට ගොදුරු වෙන්නත් පුළුවන්" මමත් මගේ දැණුම විවර කලා..

"නෑ මහත්තය එහෙම වෙන එක වලක්වා ගන්න ක්‍රම මම දන්නව".

"බලන්න ... මම දැන් මේ පැලය හිටවන්නෙ මුල් ටිකයි තේ ගසේ කඳයි මේ ලපටි වල් සූර්යකාන්ත කෝටුවට ගැට ගහල මෙහෙම හිටවනකොට මුල් ටික හරි කෙලින්ම පොලොව යටට යවන්න පුළුවන්.. මුල්ටික මතුපිට විතරක් රැඳෙන්නෙ නැහැ. අනිත් එක තේ පැලය සුලඟට හෙලවෙන එකත් ඒකෙන් වලකිනව. ..වල් සූර්යකාන්ත කෝට්ට ටික දවසකින් දිරල යන හින්ද ඒක එහෙම තිබුන කියල ප්‍රශ්නයක් වෙන්නෙත් නැහැ" සිරිපාලගෙ පිලිතුර මාව මඳක් නිහඬ කලා. "ඒත්.. ඒත්.. සිරිපාල බැග් පැළ හිටවන එක වැඩියෙ හොඳයිනෙ."

"හොඳයි .. මහත්තයල එන්න ඇත්තෙ මහපාරෙ ඉඳන් පයින්නෙ. ..ගුරු පාරෙන් මෙහා ඒ දණ්ඩ ලඟ ඉඳන් මෙතනට හැතැප්ම එක හමාරක් තියෙනවා. ..පැල ගේන ට්‍රැක්ටරේට එන්න පුළුවන් ඒ දණ්ඩ ලඟට විතරයි. ..එතන ඉඳන් බැග් පැල අරගෙන එන කොට එක වතාවකට ගේන්න පුළුවන් පැල පහලොවක් විතරයි. වැඩිම වුනොත් දවසකට පැල අරගෙන එන්ඩ පුළුවන් දහවතාවක් විතරයි. එතකොට දවසට පැල ගේන්ඩ පුළුවන් පැල 150 යි, වැඩිම වුනොත් පැල 200ක් පුළුවන්. මේ කැල්ලෙ හිටවන්ඩ පැළ 1700 ක් ඕනි. මට පැල ටික ගේන්න විතරක් රු. 2500-3000 ක් විතර යනව එච්චර සල්ලියක් මට කොහෙන්ද මහත්තයො... මට මේ කැල්ලට ම හම්බවෙන සහණාධාරෙ රු 15,000යි."

ඔහුට දෙන්නට මුදල් හෝ වෙනත් උත්තරයක් මා ලඟ තිබුනේ නැහැ.. කෙසේ නමුත්, ඔහුගෙන් සමුගන්නට පෙර ඔහුගේ තාක්ෂණය මගේ කැමරාවේ සටහන් කරගන්නට ඉඩදීමට ඔහු කාරුණික වුනා..

අප ඔහුගෙන් සමුගත්තේ ඔහුගේ තාක්ෂණය ගැන සමාලෝචනයක් කරනු වස් මතු දිනයක ද ඔහු සමග නැවත සතුටු සාමීචියක යෙදීමේ බලාපොරොත්තුවද ඇතිවය.

බී. ඒ. ඩී. සමන්සිරි